**දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ල.රා.ගි.ප්‍ර අංක 01 අනුව මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කිරීමේදි හා ඉදිරිපත් කිරීමේදී, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ සංසන්දනාත්මක තොරතුරු වශයෙන් සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී වත්කම් ප්‍රකාශ ප්‍රත්‍යාගණන සංචිත අරමුදලේ වටිනාකම වූ රු.264,500ක් ඇතුළත් කර නොතිබූ අතර වර්ෂයේ අතිරික්තය වූ රු.51,426,693ක මුදල වෙනම තීරුවක් මඟින් ඉදිරිපත් කර තිබුණු බවද නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂ සඳහා ගිණුම් පිළියෙළ කිරීමේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය ආකෘති ප්‍රකාරව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ල.රා.ගි.ප්‍ර අංක 01 අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු බව. |
| (ආ) | දේශිය ආදායම් දිරිගැන්විමේ අරමුදලට භාණ්ඩාගාරය විසින් වරින් වර ලබා දී ඇති මුදල්, උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර තැන්පතුවක තැන්පත් කර නිළධාරින්ට නිවාස ණය ලබා දීමේ අරමුණින් නිවාස ණය අරමුදලක් පිහිටුවා ඇතත්, එසේ ණය ලබා ගත් නිළධාරින් විසින් 2020 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අදාළ බැංකුවට ගෙවිය යුතු ණය ශේෂ පිළිබඳ විස්තර හා ස්ථාවර තැන්පතුව ඇප වශයෙන් තබා ඇති බව සනාථ කෙරෙන විස්තර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශණ වල සටහන් යටතේ අනාවරණය කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ස්ථාවර තැන්පතුව ඇපයට තැබීම සම්බන්ධව සහ එම ඇපය මත බැංකුව විසින් ලබා දී ඇති ණය ශේෂ පිළිබඳ විස්තර ශේෂ පත්‍ර සටහනක් ලෙස දැක්වීමට කටයුතු කරන බව. | ශ්‍රී ල.රා.ගි.ප්‍ර අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පොදු තැන්පතු ගිණුම් වලට අදාළව ආපසු ලැබිම් රු.4,287ක් හා ආදායම් ගිණුමට ලද රු.2,989ක් ශ්‍රී ල.රා.ගි.ප්‍ර අංක 2 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. එසේම, මෙහෙයුම් කටයුතු වලින් කල මුදල් ගෙවිම් වූ රු.763,433,089ක් විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අතපසුවීමකින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට මෙම තොරතුරු ඇතුළත් කර නොමැති බව හා ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවන ආකාරයට කටයුතු කරන බව. | ශ්‍රී ල.රා.ගි.ප්‍ර අංක 02 අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු බව. |
| (ඈ) | දේශීය ආදායම් දිරිදීමනා අරමුදල වෙනුවෙන් පවත්වා ගෙන යන අංක 6000/0/0/6/0/85 දරණ පොදු තැන්පත් ගිණුමේ ආරම්භක ශේෂය වන රු.163,190,675ක මුදල සමාලෝචිත වර්ෂයේ දී අරමුදල් ගිණුමට ගලපා තිබුණ ද ශ්‍රී ල.රා.ගි.ප්‍ර අංක 03 අනුව එසේ වෙනස් කරනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳව මූල්‍ය ප්‍රකාශණ වල හෙළිදරව් කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ හි අවසාන ශේෂය අවසාන ගිණුම් වල හෙළිදරව් කර තිබෙන අතර එම ශේෂය අලුතින් ජනනය වූ වටිනාකමක් නොවන බැවින් ගිණුම් වල හෙළිදරව් කිරීමක් අවශ්‍ය නොවන බව. | ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කරන්නේ නම් ඒ් බව මූල්‍ය ප්‍රකාශ සමඟ අනාවරණය කළ යුතු බව. |

**1.6** **ආයෝජන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශිය ආදායම් දිරිගැන්විමේ අරමුදලට භාණ්ඩාගාරය විසින් වරින් වර ලබා දී ඇති මුදල් උකස් හා ආයෝජන බැංකුවේ තැන්පත් කර නිළධාරීන්ට නිවාස ණය ලබා දීමේ අරමුණින් නිවාස ණය අරමුදලක් පිහිටුවා තිබුණි. තැන්පත් මුදල් හා එම මුදල ආයෝජනය කිරීම තුළින් වාර්ෂිකව උපයා ඇති පොලිය ඇතුළුව 2020 දෙසැම්බර් 31 දිනට නිවාස අරමුදලේ සමුච්චිත ශේෂය රු.37,851,984ක් විය. එහෙත් 2008 නොවැම්බර් මස සිට සමාලෝචිත වර්ෂය අවසානය තෙක්ම මෙම නිවාස අරමුදලින් නිළධාරීන් සඳහා කිසිදු ණය මුදලක් ලබා දී නොතිබූ බැවින් මෙම ණය අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු කර ගැනිමට නොහැකි වී තිබුණි. | දැනට ලබා දී ඇති ණය මුදල සම්පූර්ණයෙන් අයවෙන තුරු තව ණය ලබා දීමට නොහැකි බව හා ණය මුදල සම්පූර්ණයෙන් අයකිරිමෙන් පසුව ණය අරමුදල පිහිටුවිමේ අරමුණු ඉටු කිරිමට පියවර ගත හැකි බව. | විධිමත් අධ්‍යයනයක් සිදුකර නිවාස අරමුදල තවදුරටත් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.51,426,693ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,176,292ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.50,250,401ක වර්ධනයක් නිරීක්ෂණය විය. අංක 6000/0/0/6/0/85 දරණ පොදු තැන්පත් ගිණුමේ ආරම්භක ශේෂය වන රු.163,190,675ක මුදල සමාලෝචිත වර්ෂයේ දී අරමුදල් ගිණුමට ගලපා තිබීම මෙම වෙනසට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

අංක 6000/0/0/6/0/85 දරණ පොදු තැන්පත් ගිණුමේ ආරම්භක ශේෂය සමාලෝචිත වර්ෂයේ දී අරමුදල් ගිණුමට ගැලපීම නිසා 1003-1 වැය විෂයෙන් මාරු කල ප්‍රතිපාදන රු.794,000,000ක ආදායමක්ද, දිරිදීමනා ගෙවීම්, තේ හා ගැස් වියදම් ලෙස රු.743,905,787ක වියදම්ද අලුතින් ආදායම් වියදම් ගිණුමට ඇතුළත් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 99 (4) වගන්තිය ප්‍රකාරව, අරමුදල පරිපාලනය සඳහා වූ කාර්ය පරිපාටිය යාවත්කාලීන කර නොතිබුණි. | 1979 අංක 78 දරණ දේශීය ආදායම් පනතේ 158(අ) වගන්තිය අනුව අදාල කාර්ය පරිපාටින් මුදල් ඇමතිතුමා විසින් අනුමත කරගෙන ඇති බව. | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානයන් ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |